**ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුලි 18 දින දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,455.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,426.27 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 28.73 ක් හෙවත් සියයට 1.97 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 1,341.40 | 1,324.98 | 16.42 | 1.22 |
| මූලධන | 113.60 | 101.29 | 12.31 | 10.84 |
| **එකතුව** | **1,455.00** | **1,426.27** | **28.73** | **1.97** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය (ශීර්ෂ 153) විසින් රු.මිලියන 50.00 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 49.95 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදන වලින් රු. මිලියන 0.05 ක් ඉතිරි වී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත අංක 02 ක් සඳහා එකතුව රු.මිලියන 1,320.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 1,256.33 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 95 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10:03:07:02 | 1,300.00 | 1,240.39 | 59.62 | 4.58 |
| 10:03:08:00 | 20.00 | 15.95 | 4.05 | 20.25 |
| එකතුව | **1,320.00** | **1,256.34** | **63.67** | 4.82 |

## 2.3. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 25401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 54.00 | 54.00 | 40.00 | 52.30 | 230.00 | 180.63 |

## 2.4 අග්‍රිම ගිණුම

--------------

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0114/0016/000 දරන අග්‍රිම ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 5.96 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

-------------------------

දෙපාර්තමේන්තුව යටතේ වූ පොදු තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 1.603 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0015/0134/000 | 1.598 |
| 6000/0000/00/0018/0099/000 | 0.005 |
| | **1.603** |

## 2.6 විගණන නිරීක්ෂණය

----------------------

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

----------------------------------------------

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

----------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා වාහන හැර අනෙකුත් වත්කම් සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛන | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නැත. |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නැත. |
| (ඈ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647 (ඈ) | පවත්වා නැත. |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) | පවත්වා නැත. |

## 3.2 විගණන සාක්ෂි නොවීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2017 මැයි 31දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුමට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 4.29 ක් විය.

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 13 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 85 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබූ අතර, ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු වියදම් වැය විෂයයේ ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනයෙන් සියයට 90.59 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කිරීමෙන් පසුවද වැය විෂයයේ ඉතිරිවීම් සියයට 76 ක් විය.

(ආ) වැය විෂයයන් 16 ක් සඳහා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව රු.මිලියන 23.35 ක් මාරු කරගෙන තිබුණි. මෙයින් ඉන්ධන වැය විෂයයන් දෙක ඇතුළුව වැය විෂයයන් 03 ක ඉතිරි වීම් තිබියදී මාරුකර ගැනීම හේතුවෙන් මාරුකළ සම්පූර්ණ මුදලම ද, තවත් වැය විෂයයන් 13 ක මාරු කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 60 ක් අතර පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය.

(ඇ) 2015 වර්ෂයේ පැවැත්වූ රෙජිස්ට්‍රාර් සේවයේ තනතුරු පුරප්පාඩු පිරවීමේ තරග විභාගය සඳහා ගෙවිය යුතු මුදලට බැරකම් ඇතිකර ගැනීමක් හෝ සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමක් නොකර විභාග කොමසාරිස් ජනරාල් වෙත රු.5,802,700 ක් ගෙවා තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කර නොගෙන රු. 2,894,110 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වැය විෂයය යටතේ මිලදී ගෙන තිබුණි.

**3.4 ආදායම් ගිණුම්**
**-----------------**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 10:03:07:02 දරන ආදායම් සංකේතය - ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම් ගිණුම.**
**-----------------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් පුරෝකතනය කිරීමේදී දිවයිනේ සියළු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තොරතුරු ආවරණය කර ගැනීමට කටයුතු නොකර දෙපාර්තමේන්තුව විසින් පුරෝකතනය කළ රු.මිලියන 1,100 ක මුලික ආදායම් ඇස්තමේන්තුව භාණ්ඩාගාරය විසින් රු.මිලියන 1,640 ක් වශයෙන් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කර පසුව එය රු.මිලියන 1,300 ක් ලෙස සංශෝධනය කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් රැස්කිරීම රු.මිලියන 1,240 ක් විය.

(ii) පෙර වර්ෂයන්හි හිඟහිටි ආදායම රු. 7,975,807 කින් අයකිරීම් රු. 1,797,672 ක් හෙවත් සියයට 22.5 ක් පමණක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ හිටි ආදායම රු. 11,566,923 ක් විය. එසේම, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 06 ක පැවති ආරම්භක හා අවසාන වැඩිපුර අයකිරීම් පිළිවෙලින් රු. 869,849 ක් හා රු. 303,310 ක් අයවිය යුතු ශේෂයන්ට හිලව් කර දක්වා තිබීම හේතුවෙන් ආදායම් ගිණුමේ අයවිය යුතු ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබූ අතර, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් නියමිත පරිදි මාසික වර්ගීකරණ වාර්තා ලබාගෙන තථ්‍ය ආදායම හා හිඟ ආදායම සමඟ සැසඳීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) 10:03:08:00 දරන ආදායම් සංකේතය - නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු ආදායම**

**-------------------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආදායම් ඇස්තමේන්තු පුරෝකථනය කර ආදායම් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඉකුත් වර්ෂයේ රු.මිලියන 14.4 ක් වූ ශුද්ධ ආදායම හා 12,925 ක් වූ ලියාපදිංචි වී සිටි නොතාරිස් සංඛ්‍යාව පිළිබඳව සැළකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පුරෝකතනය කළ රු.මිලියන 12.5 ක මූලික ආදායම් ඇස්තමේන්තුව භාණ්ඩාගාරය විසින් රු.මිලියන 25.0 ක් වශයෙන් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කර පසුව එය රු. මිලියන 20.0 ලෙස වෙනස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු.15,951,778 ක් විය.

(ii) නොතාරිස්වරුන් අළුතෙන් ලියාපදිංචි වීම, ලියාපදිංචිය අළුත් කිරීම, වෙනත් භාෂාවකින් කටයුතු කිරීම, අධිකරණ කළාප මාරු කිරීම ආදි කටයුතු සඳහා බලපත්‍ර ගාස්තු රු. 2,000 ක් හා රු. 1,000 ක් බැගින් වුවද, තථ්‍ය රැස්කළ ආදායම රු. 15,951,778 ක් ලෙසට අවසාන ඉලක්කම් තුන "778" ක් වීමෙන් තථ්‍ය ආදායම නිවැරදි බවට සනාථ කළ නොහැකි විය. තවද, සමාලෝචිත වර්ෂයේදී මියගිය හා ඉවත් වූ නොතාරිස්වරුන් පිළිබඳව සොයාබලා නොතාරිස් නාම ලේඛනයෙන් ඉවත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-------------------------------------------------------------------------**

විෂයය අංක 25401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 219 දෙනෙකුගෙන් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,633,947 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ මාස 01 ක සිට වසර 31 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වත්කම් විසර්ජන ගිණුම මඟින් නිවැරදිව හෙළිදරව් නොකිරීම.**

**---------------------------------------------------------------------**

දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ සටහන් කර තිබූ වාහන 08 ක වටිනාකම රු. 39,300,000 ක් වැය ශීර්ෂ අංක 153 ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් මිලදී ගැනීම් යටතේ ද සටහන් කර තිබීම හා වාහන 11 ක වටිනාකම රු. 63,783,500 ක් විසර්ජන ගිණුමට ඇතුළත් නොකිරීම හේතුවෙන් විසර්ජන ගිණුමෙන් නිරූපිත වාහන වටිනාකම නිවැරදි නොවුණි.

(ආ) **බේරුම් නොකළ බැරකම්**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු බැරකම් රු.12,894,648 ක් විය.

(ii) බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 07 ක ඉතිරිය ඉක්මවා රු.6,048,671 ක බැරකම් සඳහා බැඳීම් ඇති කරගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතුව තිබු රු. 2,279,848 ක බැරකම් විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් කර නොතිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (අ) මුදල් රෙගුලාසි 177 (1) | පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ මාස 03ක ලැබීම් සම්බන්ධ පරීක්ෂාවේදී අවස්ථා 08 කදී දෛනික ලැබීම රු. 374,150 ක් බැංකුගත කිරීමේදී දින 02 ක සිට දින 05 ක් දක්වා කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. |
| (ආ) මුදල් රෙගුලාසි 342 | ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ආදායම් රැස්කිරීමේ කවුන්ටර්වලට රිසිට් පොත් භාරදීමේ දී අවස්ථා 53 ක දී රිසිට් පොත් 265 ක් දින රහිතව, දින අනුපිළිවෙලින් බැහැරව හා අත්සන් රහිතව භාර දී තිබීම නිසා උප පත්‍රිකා පොත් සුරක්ෂිතව පරිහරණය නොකෙරෙන බව නිරීක්ෂණය විය. |

## 3.8 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### 3.8.1 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් පහත කාර්යයන් 03 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර ගැනීමට නොහැකිවී තිබූ අතර එම කාර්යයන්හි මූල්‍ය හා භෞතික ඉලක්කයන් සඳහන් කර නොතිබුණි.

- (i) උපත්, මරණ, විවාහ පරිලෝඛනය කිරීමේ වැඩසටහන (e-BMD).
- (ii) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- (iii) විවාහය පිළිබඳ තොරතුරු ඉ-ජනගහන තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොවූ අවස්ථා 02 ක් පහත දැක්වේ.

- (i) 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ඊ-ජනගහන ලේඛන වැඩසටහන යටතේ 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා දිවයිනේ සිදුවූ උපත් 1,741,330 කින් 1,356,829 ක්ද , මරණ 639,324 කින් 453,465ක්ද ඊ-ජනගහන ලේඛන වැඩසටහනට ඇතුළත් කිරීමට නොහැකි වී තිබූ අතර, එහි ප්‍රගතිය පිළිවෙලින් සියයට 22 ක් හා සියයට 29 ක් විය. තවද, 2014 වර්ෂයේ දී හඳුන්වාදුන් මන්නාරම, වවුනියා, මුලතිව් හා කිලිනොච්චි යන දිස්ත්‍රික්කයන්හි උපත් හා මරණ පිළිබඳ තොරතුරු කිසිවක් දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි.
- (ii) බිම්සවිය වැඩසටහන යටතේ හිමිකම් ඔප්පු 100,000 ක් ලියාපදිංචි කිරීමට ඉලක්ක කළ ද, ලියාපදිංචි කර තිබුණේ හිමිකම් ඔප්පු 35,100 ක් හෙවත් සියයට 35 ක් පමණි.

## 3.9 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2013 වර්ෂයේ දී සිදුවී ඇති බවට අනාවරණය කරගෙන තිබූ පත්ඉරු නිකුත් කිරීමට අදාළ මුදල් අක්‍රමිකතාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අදාළ අලාභය ගණනය කර අයකර ගැනීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකර ඊට වගකිව යුතු බවට හඳුනාගෙන තිබූ නිලධාරිණිය වෙනත් කාර්යාලයක් වෙත ස්ථාන මාරු කර තිබුණි.

## 3.10 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද වලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | වර්ෂය | ඡේද අංකය | |
| (අ) | 2015 | 3.6.1 | සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන සකස් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2015 | 3.6.2 | සමාලෝචිත වර්ෂයේදීත් ප්‍රධාන අභ්‍යන්තර විගණකයකු පත්කිරීමට කටයුතු කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන අංශයේ තථ්‍ය කාර්යමණ්ඩලයට නිලධාරීන් 04 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. |
| (ඇ) | 2015 | 3.6.4 | අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු වුවත් පෙර වර්ෂයේ දී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 2 ක් පමණක් පවත්වා තිබූ අතර එම කමිටු රැස්වීම් වලදී විගණන වාර්තා සමාලෝචනය කිරීමට ද කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2015 | 3.7(අ) | රජයේ වෙනත් ආයතන 04 ක් විසින් 2010 – 2014 කාලපරිච්ඡේදය තුළ දෙපාර්තමේන්තුවට ලබාදී තිබූ වර්ග කිහිපයකට අයත් ස්ථාවර වත්කම් ඒකක 60 ක් තක්සේරුකොට වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |

## 3.11 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ගම්පහ, පානදුර හා දෙල්කද ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල කටයුතු රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාගේ අත්පොත සමඟ නියැදි පරීක්ෂා කිරීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) නොතාරිස්වරුන් විසින් ලියා අත්සන් කළ ඔප්පුවල දෙවන පිටපත් ඊළඟ මාසයේ වැනි 15 දිනට පෙර අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාරදිය යුතු වුවද, නොතාරිස්වරුන් 50 දෙනෙකු විසින් ඔප්පු දෙවන පිටපත් 313 ක් භාර දී නොතිබීමත් තවත් නොතාරිස්වරුන් 33 දෙනෙකු විසින් ඔප්පු දෙවන පිටපත් 313 ක් ප්‍රමාද කර භාර දී තිබීමත්, ඔප්පු ලියා අත්සන් නොකරන ලද නොතාරිස්වරුන් 103 දෙනෙකු විසින් හිස් වාර්තා ඉදිරිපත් නොකිරීමත්, සම්බන්ධයෙන් විධිහීනතා වාර්තා පිළියෙල කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ඔප්පු දෙවන පිටපත් නොතාරිස් පරීක්ෂණ පොතේ ඇතුළත් කිරීමට ගම්පහ හා පානදුර කාර්යාල විසින් පිළිවෙලින් මාස 08 ක හා මාස 04 ක කාලයක් ප්‍රමාද කර තිබීම නිසා විධිහීනතා නිකුත් කර සමථ, හිඟ හා දඩ මුදල් අයකර ගැනීමද ප්‍රමාද වී තිබුණි.

(ii) ගම්පහ හා පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල නොතාරිස්වරුන්ගෙන් අයවිය යුතු හිඟ හා දඩ මුදල් එකතුව රු.2,083,094 ක් පිළිබඳව අදාළ නොතාරිස්වරුන් දැනුවත් කර පළාත් ආදායම් කොමසාරිස් වෙත යොමුකිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) අයදුම්කරුවන් වෙත අප්‍රමාදීව නිකුත් කළ යුතු පත්ඉරු සහ ඔප්පු පිටපත් නිකුත් කිරීම අවස්ථා 161 ක දී මාසයකට අධික කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාරව හිමිකම් ලියාපදිංචි කිරීමේ පසු ගණුදෙනුවලින් රැස් කරන ලද ආදායම රු. 22,673,736 ක් බවට වාර්තාකර තිබුණද, එම ආදායම, හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලබාගත් බැංකු තැන්පත් පත්‍රිකා හා ආදායම් වාර්තා සමඟ සසඳා නොතිබීමත්, බැංකුවට බැර වූ රු. 2,472,400 ක් හඳුනාගත නොහැකි වීමත්, රැස් කළ ආදායමෙන් බැංකුව විසින් අඩුකර ගෙන තිබූ රු. 253,770 ක් කුමන ආකාරයේ අඩු කිරීම් ද යන්න හඳුනා ගැනීමට කටයුතු නොකිරීමත් හේතුවෙන් රැස්කළ ආදායමේ නිවැරදිතාවය සනාථ කර ගත නොහැකි විය.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 18 | 25 |
| (ii) | තෘතියික මට්ටම | 586 | 544 | 42 |
| (iii) | ද්විතියික මට්ටම | 1360 | 1090 | 270 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 673 | 598 | 75 |
| | **එකතුව** | 2662 | 2250 | 412 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 412 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබූ අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සංඛ්‍යාවේ පුරප්පාඩුව අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 58 ක් විය.

(ii) ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා සෘජුවම මැදිහත් වන ද්විතීයක සහ තෘතියික මට්ටමේ තනතුරු 312 ක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපානු ලබන බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

(iii) ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 4.1 ඡේදය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා පත්කිරීම කැබිනට් මණ්ඩලය විසින් සිදුකළ යුතු නමුත්, 2017 ජනවාරි මාසයේදී දින පුරප්පාඩු වූ රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ රාජකාරි ආවරණය කිරීම රේඛීය අමාත්‍යවරයා විසින් එම අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා තිබුණි.